**අග්නිදිග විශ්වවිද්‍යාලය - 2022**

**-------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

අග්නිදිග විශ්වවිද්‍යාලයේ("විශ්වවිද්‍යාලය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ

අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

#### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.2,081,685,748 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය වී තිබුණද, ඒවා තවදුරටත් භාවිතා කරමින් පැවතුණි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS) 7 හි 65 වැනි ඡේදය අනුව එම වත්කම්වල ප්‍රයෝජනවත් ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණු අතර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 අනුව ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | එම ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කරනු ලබන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 7 හි 47 වැනි ඡේදය ප්‍රකාරව සෑම වසර තුනකට හෝ පහකට වරක් දේපළ, පිරියත සහ උපකරණවල සාධාරණ වටිනාකම නැවත තක්සේරු කළ යුතු වුවද, විශ්වවිද්‍යාලයේ ඉඩම් 05ක් 2011 වසරෙන් පසු නැවත තක්සේරු කර නොතිබුණි. | විශ්වවිද්‍යාල ඉඩම් 05 නැවත තක්සේරු කිරීමට රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා ඇති අතර මෙම කාර්යය ඉදිරියේදී අවසන් කිරීමට නියමිත බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |

#### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පිරිවැය රු. 1,400,203 ක්වූ ගොඩනැගිල්ල නිම කර 2022 මැයි 02 දින විශ්වවිද්‍යාලයට භාර දී තිබුණද, එම ගොඩනැගිල්ලේ වටිනාකම දේපල, පිරියත සහ උපකරණ යටතේ ප්‍රාග්ධනිත කිරීම වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. | මෙම වත්කම් 2023 වර්ෂයේදී දේපල, පිරියත සහ උපකරණ යටතේ දැක්වීමට කටයුතු කරන බව. | නිම කරන ලද වැඩ අදාළ වර්ෂය තුළදී ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

පහත සදහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>------------------- | | | |
| | (i)මුදල් රෙගුලාසි 103(1) | 2021 වසර සඳහා වන මිනින්දෝරු මණ්ඩල වාර්තාවට අනුව විශ්වවිද්‍යාල කොට්ඨාස 18කින් භාණ්ඩ 80ක් අස්ථානගත වී ඇතැයි වාර්තා වේ. කෙසේ වෙතත්, මූල්‍ය රෙගුලාසිවලට අනුව පියවර ගෙන නොතිබුණි. | සිදු වූ අලාභය සම්බන්ධයෙන් පැහැදිලි කිරීම් ලබාගෙන ක්‍රියාමාර්ග ගන්නා අතර ඔවුන්ගෙන් ලැබෙන ප්‍රතිචාර මත ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. | පාඩු සම්බන්ධයෙන් මූල්‍ය රෙගුලාසියේ උපදෙස් පිළිපැදිය යුතුය. |
| | (ii) මුදල් රෙගුලාසි 571 | රැඳවුම් මුදල් රු. 18,403,762ක් සහ ආපසු ගෙවිය යුතු තැන්පතු රු.329,000ක් වසර 03 සිට 10 දක්වා කාලයක් තුළ පියවීමට හෝ රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු නොකර ගිණුම්වල රඳවාගෙන තිබුණි. | වසර දෙකකට වඩා වැඩි කාලයක් තුළ ඉල්ලුම් නොකළ මුදල් ආදායමට ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගනු ලබන බව. | මුදල් රෙගුලාසිවල උපදෙස් පරිදි කාලය ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය<br><br>XIX පරිච්ඡේදයේ 5.4 වගන්තිය | 2014 වසරේ සිට 2022 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී විශ්වවිද්‍යාලයේ නිල නිවාසවල පදිංචි අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 37 දෙනෙකුගෙන් සහ පරිපාලන නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු රු.20,130,410ක මුදල අය කර ගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි. | විශ්වවිද්‍යාල පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද සහ අතුරු ව්‍යවස්ථාවේ දක්වා ඇති පරිදි විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල නිල නිවාසවල පදිංචි කුලී නිවැසියන්ගේ මාසික වැටුපෙන් නිසි පරිදි අයකර ගනු ලබන බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කාර්ය මණ්ඩල නිල නිවාසවල පදිංචි කුලී නිවැසියන්ගෙන් හිඟ කුලිය අයකරගත යුතුය. |
| (ඇ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන | (i) විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහ පුස්තකාල කාර්යය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම තහවුරු කර නොගෙන සමාලෝචිත | ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිවල අධ්‍යයන කාර්ය මණ්ඩලය සාමාන්‍යයෙන් පැමිණීමේ ලේඛනයේ අත්සන් කරනු නොලබන | ආයතන සංග්‍රහයේ හා චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව |

| | | | | |
|---|---|---|---|---|
| | ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3 (i)වගන්තිය සහ 2017 ජූලි 10 දිනැති අංක 10/2017 දරන විශ්වවිද්‍යාල කොමිෂන් සභාවේ චක්‍රලේඛ ලිපිය | වර්ෂය තුල දී වැටුප් හා දීමනා ලෙස රු.716,558,562ක් ගෙවා තිබුණි. | බව. | කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයෙහි උප වගන්තිය 03(X) (2022 අප්‍රේල් 27 දිනැති අංක 04/2022 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා මූල්‍ය චක්‍රලේඛ ලිපිය) | මෙම චක්‍රලේඛ විධිවිධාන මගින් මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ට ණය පහසුකම් ලබාදීම අත්හිටුවා තිබුණද මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් 12 දෙනෙකු සඳහා විශ්වවිද්‍යාලය විසින් රු.2,556,943ක ණය පහසුකම් ලබාදී තිබුණි. | විශ්වවිද්‍යාල සේවකයන්ට මෙම ණය ගෙවීම සඳහා අයකර ගැනීම් හෝ අභ්‍යන්තරව ජනනය කරන ලද අරමුදල් භාවිතා කර ඇති බව. | චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය. |
| (ඉ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 2022 පෙබරවාරි 23 දිනැති අංක 03/2022 දරන මුදල් චක්‍රලේඛ ලිපිය | 2022 වර්ෂය සඳහා රාජ්‍ය විශ්වවිද්‍යාලවල උපකුලපතිවරුන්ට මාසික ඉන්ධන සීමාව ලීටර් 145කට සීමා කර තිබුණි. කෙසේ වෙතත්, රු. 579,687ක් වටිනා ඉන්ධන ලීටර් 1,942ක්. 2022 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ අනුමත සීමාව ඉක්මවා ලබා දී තිබුණි. | 2022 ජනවාරි සිට 2022 ජූනි දක්වා කාලපරිච්ඡේදය සඳහා අතිරේක ඉන්ධන පරිභෝජනය වෙනුවෙන් අනුමැතිය ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කර ඇති අතර ඔවුන් 2022 ඔක්තෝම්බර් මාසයේදී එම ලේඛන විශ්වවිද්‍යාලයට ආපසු එවා තිබුණි. තවද, 2022 අගෝස්තු සිට 2022 දෙසැම්බර් දක්වා වූ කාලය සඳහා අතිරේක ඉන්ධන පරිභෝජනය වෙනුවෙන් පාලක සභාවෙන් අනුමැතිය ලබා දී තිබුණි. | ඉන්ධන භාවිතය සම්බන්ධයෙන් චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය | විශ්වවිද්‍යාලය විසින් අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා 18 දෙනෙකු බඳවාගෙන මුදල් අමාත්‍යාංශයේ විශේෂ අනුමැතියකින් තොරව රු.2,270,995 ක් ගෙවා තිබුණි. | තවද, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන නකාමිෂන් සභාව විසින් 2022.09.23 දිනැති කැබිනට් තීරණයෙන් පසුව පමණක් සිදු කරන ලද පත්වීම් පිළිබඳ විස්තර ඉල්ලා තිබුණි. කෙසේ වෙතත් ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාශ කිරීමට පෙර ඉහත පත්වීම් 18ම සිදු කර ඇති බව සඳහන් කළ යුතුය. | අධ්‍යයන කාර්ය මණ්ඩලය පත් කිරීමේදී චක්‍රලේඛ උපදෙස් පිළිපැදිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මෙහෙයුම් ප්‍රතිඵලය රු.130,456,831 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.32,976,512 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.163,433,343 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රධාන හේතු වනුයේ පෙර වර්ෂයේ මුළු ආදායම රු.171,551,372 ට සාපේක්ෂව රු.39,518,390 කින් එනම් සියයට 23 කින් ඉහළ යාම සහ පෙර වසරට සාපේක්ෂව මෙහෙයුම් වියදම් රු.202,951,732 කින් ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂය සඳහා පුද්ගලික වැටුප්, සැපයුම්, කොන්ත්‍රාත් සේවා සහ ස්වයං මූල්‍ය වැඩසටහන් වැනි විශ්වවිද්‍යාල වියදම් පෙර වසරට සාපේක්ෂව සියයට 30 සිට සියයට 303 දක්වා වැඩිවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශාස්ත්‍රවේදී උපාධිය සඳහා වන බාහිර උපාධි වැඩසටහනේ ශිෂ්‍ය මාර්ගෝපදේශ පොතට අනුව, ව්‍යාපාර පරිපාලන උපාධිය සහ වාණිජවේදී උපාධිය අධ්‍යයන වර්ෂ 03ක් ඇතුළත සම්පූර්ණ කිරීමට නියමිතය. කෙසේ වෙතත්, උපාධි පාඨමාලා වසර 05 සිට 08 දක්වා කාලය සම්පූර්ණ කිරීමට ගත වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම ප්‍රමාදය සිසුන්ගේ වෘත්තීය සහ රැකියා අවස්ථා කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකිය. | කණ්ඩායමක සිසුන් සංඛ්‍යාව වැඩි බැවින් පිළිතුරු පත්‍ර ලකුණු කිරීම අවසන් කිරීමට ගතවන කාලය හේතුවෙන් ප්‍රධාන ප්‍රමාදය සිදු විය. එබැවින්, අපි පැනල් ලකුණු කිරීම ක්‍රියාත්මක කර මාස තුනක කාලයක් තුළ ප්‍රතිඵල නිකුත් කිරීමට තීරණය කර ඇත. | නියමිත කාලය තුළ උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2017 සිට 2022 දක්වා කාලය තුළ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ 36දෙනෙකු සඳහා රු.15,307,313 ක පර්යේෂණ ප්‍රදාන ලබා දී තිබුණි. කෙසේ වෙතත්, අධ්‍යයන කාර්ය මණ්ඩලය 36 දෙනාගෙන් 18දෙනෙකු 2023 මැයි 31 දින වන විටත් සිය පර්යේෂණ අවසන් කර නොතිබුණි. | කෝවිඩ් - 19 හේතුවෙන් රට වසා දැමීම, රටේ දේශපාලන හා ආර්ථික අස්ථාවර තත්ත්වයන් හේතුවෙන්, බොහෝ පර්යේෂකයන් දින දීර්ඝ කිරීම් ඉල්ලා සිටි අතර ඒවා තවමත් සම්පූර්ණ කිරීමට නොහැකි වී තිබුණි. | නියමිත කාල සීමාව තුළ පර්යේෂණ කටයුතු අවසන් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | කලා හා සංස්කෘතික පීඨයේ ආර්ථික විද්‍යාව සහ සංඛ්‍යාලේඛනය පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරට බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණය 2021 අගෝස්තු 07 දින පැවැත්වුණි. ඒ අනුව සුදුසුකම් ලත් අයදුම්කරුවන් දොළොස් දෙනෙකුගෙන් (12) පස් දෙනෙකු (05) සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබීය. ඉන්පසුව, කෘෂිකර්මය පිළිබඳ BSc උපාධියක 2 වන පන්තියේ ඉහළ සාමාර්ථයක් සහිත අයදුම්කරුවෙකු ඉහත තනතුර සඳහා තේරීම් කමිටුව විසින් නිර්දේශ කර තිබුණි. කෙසේ වෙතත්, මෙම අයදුම්කරු 1 වන කාණ්ඩය වෙනුවට 3 වන කාණ්ඩය යටතේ කෙටි ලැයිස්තුගත කර ඇත. නිර්දේශිත අයදුම්කරුගේ කාණ්ඩය හිතාමතාම වැරදි ලෙස අර්ථකථනය කිරීම සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාට චෝදනා එල්ල වී තිබුණි. මේ සම්බන්ධයෙන් දෙවන ශ්‍රේණියේ අයදුම්කරු විසින් තම මූලික අයිතීන් උල්ලංඝනය වන බව පවසමින් මානව හිමිකම් කොමිසමට පැමිණිල්ලක් ගොනු කරන ලදී. මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පැමිණිල්ල තහවුරු කළ අතර දෙවන ශ්‍රේණිගත අයදුම්කරු පත් කිරීමට නිර්දේශ කරන ලදී. කෙසේ වෙතත්, 2005 ඔක්තෝබර් 05 දිනැති අංක 17/2005 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සහ 2006 පෙබරවාරි 23 දිනැති අංක 03/2006 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන චක්‍රලේඛයේ මාර්ගෝපදේශ නොසලකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශය ක්‍රියාත්මක කිරීමට උපකුලපතිවරයා අපොහොසත් වී තිබුණි. | සියලුම කාණ්ඩවල කථිකාචාර්යවරුන් බඳවා ගැනීම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 721 මගින් පාලනය වේ. මේ අනුව, අපේක්ෂකයින් කථිකාචාර්ය (පරිවාස) සඳහා අවශ්‍ය අධ්‍යයන සුදුසුකම් ඇති අය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II සහ I ශ්‍රේණිය සඳහා සුදුසුකම් ලබයි, අදාළ ක්ෂේත්‍රයේ ශාස්ත්‍රපති හෝ ආචාර්ය උපාධි තිබේ නම් අවශ්‍ය පරිදි. අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.<br>මේ අනුව, තේරීම් කමිටුව සාමූහිකව ලකුණු ලබා දී ඔහුගේ සුදුසුකම් සහ පළපුරුද්ද සැලකිල්ලට ගනිමින් ආර්ථික විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණියේ තනතුරට වඩාත් සුදුසුකම් ලත් අපේක්ෂකයා නිර්දේශ කළ අතර එය අග්නිදිග විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් අනුමත කරන ලදී. එපමණක් නොව, මේ සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසමේ නිර්දේශ විශ්වවිද්‍යාලය විසින් සැලකිල්ලට ගෙන ඇත. තවද ආර්ථික විද්‍යාව පිළිබඳ කථිකාචාර්යවරයෙකු පත් කිරීම අභියෝගයට ලක් කරමින් අභියාචනාධිකරණය හමුවේ ගොනු කර ඇති නඩුවක් ද අවසන් තීරණය සඳහා විභාග වෙමින් පවතී. (නඩු අංකය - CA (රිට්) අයදුම්පත් අංක 261/2022) | තනතුරු සඳහා පත් කිරීමේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපදෙස් හා චක්‍රලේඛ උපදෙස් යටතේ ගත යුතු ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 සිට 2019 දක්වා කාලය තුළදී මිළදී ගෙන තිබූ රු.24,397,000 ක් වටිනාකමැති රසායනාගාර උපකරණ දෙකක් වසර 4 කට වැඩි කාලයක් අනිෂ්ක්‍රියව පැවතුණි. | අනාගතයේදී එවැනි ප්‍රමාදයන් සහ නිෂ්ක්‍රිය තත්ත්වයන් වැළැක්වීම සඳහා දැඩි අධීක්ෂණය සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරනු ලබන බව. | මිලදී ගත් භාණ්ඩ ප්‍රයෝජනයට ගැනීමටත්, අනාගතයේදී නිෂ්ක්‍රීය තත්ත්වයන් වළක්වා ගැනීමටත් ඵලදායී ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මල්වත්ත කෘෂි තාක්ෂණික උද්‍යානයේ යටිතල පහසුකම් සංවර්ධනය (වෙන්කරන ලද වැඩ ඒකක 19 ක්) සඳහා රු.138,444,958 ක් (වැට් බද්ද රහිතව) වටිනාකමකට කොන්ත්‍රාත්කරුවෙකුට නියමිත වැඩකටයුතු 2022 ජූනි 28 හෝ ඊට පෙර නිම කිරීම සඳහා 2021 මාර්තු 29 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. මේ සම්බන්ධයෙන්, වැඩ අවසන් කර තිබුණේ සියයට 45 ක් පමණක් වන අතර, රු.39,390,993ක වැඩ ඒකක 05 ක් 2023 මැයි 31 වන විටත් ආරම්භ කර නොතිබුණි. | සිසුන් විසින් පර්යේෂණ සහ අධ්‍යයන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අපට ව්‍යාපෘතිය නැවත ඇගයීමට ලක් කර නව කොන්ත්‍රාත්තුවක් සඳහා නැවත ලංසු තැබීමේ ක්‍රියාවලියක් ආරම්භ කළ හැකි බව.<br>වසංගත සහ අයහපත් කාලගුණය වැනි කොන්ත්‍රාත්කරුගේ පාලනයෙන් බැහැරව ගිය තත්වයන් ව්‍යාපෘතියේ ප්‍රගතියට සැලකිය යුතු ලෙස බලපා ඇති බව පිළිගැනීම ඉතා වැදගත් බව. | තවදුරටත් ප්‍රමාදයකින් තොරව ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |